පොදු චක්‍රලේඛ අංක - 05/2026

මගේ අංකය:DCD/SP/02/04/01
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
147/3, පෙට්ටිගලවත්ත,
ගාල්ල.
2026.05. 07

සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්,
ගාල්ල/මාතර/හම්බන්තොට.

**<u>දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තියේ 53 වගන්තිය යටතේ ආරවුල් බේරුම් කිරීම සඳහා බේරුම්කරුවන් පත් කිරීම හා තීරක ගාස්තු ගෙවීම.</u>**

සමුපකාර සමිතිවල ආරවුල් බේරුම්කරණය සඳහා දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ CSS/07/01/03 අංක දරණ 2026.03.31 සහ 2026.04.29 දිනැති CSS/7/1/1-6 අංක දරණ ලිපි මගින් දන්වා ඇති පරිදි සහ දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/SP/3/8/1353 දරණ 2026.03.27 සහ 2026.05.04 දිනැති ලිපි මගින් ලබා දී ඇති අනුමැතියට යටත්ව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. සමුපකාර සමිතිවල ණය හා විවිධ ආරවුල් බේරුම්කරණය වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු 2003-99-04 (ණය/විවිධආරවුල් සඳහා ගාස්තු අයවීම්) ආදායම් ශීර්ෂය යටතේ ගිණුම්ගත කිරීමටත්, ඊට අදාල වියදම් පහත වැය විෂයයන් යටතේ ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතුය.

1) 317-53-2-3-1409 - විවිධසේවා වියදම් (තීරකකරණ කටයුතු)
2) 317-53-2-1-1201 - ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා (තීරකකරණ කටයුතු)
3) 317-53-2-1-1402 - තැපැල් හා සන්නිවේදන (තීරකකරණ කටයුතු)

03. ඒ අනුව ආරවුලේ වටිනාකම නොසලකා එක් ණය ආරවුලක් සඳහා තීරක ගාස්තුව රු.3,000/- ක් සහ ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු රු.1,200/- ක්ද වශයෙන් එක් ණය ආරවුලක් සඳහා තැන්පත් කලයුතු මුළු තීරක ගාස්තුව රුපියල් 4,200/- ක් වේ. ඒ අනුව තැපැල් ගාස්තු සඳහා වැය වන වියදම උපරිම රු.1,200/- ක් දක්වා ලියාපදිංචි තැපැල් කුවිතාන්සි ඉදිරිපත් කර ප්‍රතිපූරණය කරගත යුතු අතර, එම මුදල තැපැල් වියදම සඳහා පමණක් අදාල කරගත යුතුය.

04. විවිධ ආරවුල් සඳහා තීරක ගාස්තු මෙසේය.

| | තීරක ගාස්තු රු. | ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු රු | එකතුව රු. |
|---|---|---|---|
| රු.5,000/- දක්වා | 3,000/- | 1,000/- | 4,000/- |
| රු.5,001/- සිට රු.10,000/- දක්වා | 5,000/- | 1,500/- | 6,500/- |
| රු.10,001/- සිට 25,000/- දක්වා | 7,500/- | 2,000/- | 9,500/- |
| රු.25,001/- සිට 100,000/- දක්වා | 12,000/- | 2,000/- | 14,000/- |
| රු.100,001/- සිට 250,000/- දක්වා | 15,000/- | 2,500/- | 17,500/- |
| රු.250,001/- සිට 500,000/- දක්වා | 30,000/- | 2,500/- | 32,500/- |
| රු.500,001/- සිට 2,000,000/- දක්වා | 40,000/- | 4,000/- | 44,000/- |
| රු.2,000,001/- සිට 3,000,000/- දක්වා | 45,000/- | 5,000/- | 50,000/- |
| රු.3,000,001/- සිට 5,000,000/- දක්වා | 50,000/- | 5,500/- | 55,500/- |
| රු.5,000,001/- ට වැඩි | 65,000/- | 6,000/- | 71,000/- |

05. ආරවුල් බේරුම් කිරීම සඳහා නිළධාරීන් පත් කිරීමේදී පහත සඳහන් **නියමයන්** පරිදි ක්‍රියා කළයුතු වේ.

I. ආරවුලේ වටිනාකම නොසලකා සියළුම ණය ආරවුල් බේරුම් කිරීම සඳහා බේරුම්කරුවන් පත් කිරීමේදී පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සමුපකාර සංවර්ධන නිළධාරීන් සඳහා වන පළමු පෙළ විභාගය සමත්ව අවුරුදු පහක (5) සේවා කාලයක් සම්පූර්ණ නිළධාරීන් පත් කිරීමට කටයුතු කළ යුතුය.

II. සෑම දිස්ත්‍රික් කාර්යාලයකම බේරුකරුවන්ගේ නාමලේඛණයක් පවත්වාගෙන යාමට කටයුතු කලයුතු අතර, ලබාදෙන ආරවුල් බේරුම්කරණය කර කාර්යාලය වෙත ලබාදීමේ අනුපිළිවෙල අනුව ණය සහ විවිධ ආරවුල් සඳහා වෙන්ව **ප්‍රමුඛතා ලේඛණ** සෑම කාර්යාලයකම විෂය නිළධාරී විසින් නිසි පරිදි නඩත්තු කර පවත්වාගෙන යාමට කටයුතු කළයුතුය. අඛණ්ඩව එම ප්‍රමුඛතා ලේඛණය පදනම්ව නැවත ආරවුල් බේරුම්කරණය සඳහා යොමු කිරීමට කටයුතු කළයුතුය.

III. ණය ආරවුල් යොමු කිරීමේදී එකවර ආරවුල් 10ක උපරිමයකට යටත්ව ආරවුල් භාරදිය යුතු අතර, එම ආරවුල් විභාග කර වාර්තා භාරදීමෙන් පසු නැවත ආරවුල් යොමුකල යුතුය. එක් එක් දිස්ත්‍රික්කයේ පවතින ණය ආරවුල් සංඛ්‍යාව අධික වූ විට නිළධාරියාට භාර දෙන ආරවුල් ප්‍රමාණය 10 සිට 20 දක්වා වැඩි කිරීමට මාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව සිදු කල හැකිය.

IV. විවිධ ආරවුල් යොමු කිරීමේදී ආරවුලේ වටිනාකම මත නිලධරයාගේ සේවා කාලය සහ ශ්‍රේණිය පදනම් කරගෙන පහත සඳහන් සුදුසුකම් සහිත නිළධරයන් පත් කිරීමට කටයුතු කලයුතු අතර, රු.2,000,000/- දක්වා වටිනාකමකින් යුක්ත ආරවුල් සඳහා බේරුම්කරුවන් පත් කිරීමේදී එම දිස්ත්‍රික්කයේ රාජකාරියේ නියුතු නිළධාරීන් පත් කිරීමට කටයුතු කළ යුතුය.

V. රු.5,000,000/- ට වැඩි වටිනාකමකින් යුත් විවිධ ආරවුල් සඳහා බේරුම්කරුවන් හෝ බේරුම්කාර මණ්ඩලයක් පත් කිරීමට මා වෙත ඉදිරිපත් කල යුතුය. එසේම බේරුම්කාර මණ්ඩලයක් පත්කිරීම රීති මාලාවේ විධිවිධාන අනුව සිදු කලයුතු අතර, බේරුම්කාර මණ්ඩලයේ තීරක ගාස්තු ගෙවීම සම්බන්ධව සමිතිය වෙත දැනුම්දීම සඳහා **පූර්ව අනුමැතිය** ලබා ගැනීමට මා වෙත ඉදිරිපත් කල යුතුය.

| | |
|---|---|
| රු.5,000/- දක්වා ආරවුල් | පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සමුපකාර සංවර්ධන නිළධාරීන් සඳහා වන පළමු පෙළ විභාගය සමත්ව වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කල සමු.සං.නිලධාරී ii ශ්‍රේණියේ නිළධාරීන් |
| රු.5,001/- සිට රු.50,000/- දක්වා ආරවුල් | ස.සං.නි.ii ශ්‍රේණියේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරීන් |
| රු.50,001/-සිට රු.100,000/- දක්වා ආරවුල් | ස.සං.නි.ii ශ්‍රේණියේ වසර 07 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරීන් |
| රු.100,001/-සිට රු.250,000/- දක්වා ආරවුල් | ස.සං.නි.i ශ්‍රේණියේ නිළධාරීන් |
| රු.250,001/- සිට රු.2,000,000/- දක්වා ආරවුල් | ස.සං.නි.i ශ්‍රේණියේ වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරීන් |
| රු.2,000,001/- සිට රු.5,000,000/- දක්වා ආරවුල් | ස.සං.නි.i ශ්‍රේණියේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරීන් |
| රු.5,000,001/- ට වැඩි ආරවුල් | ස.සං.නි.i ශ්‍රේණියේ වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරීන් |

06. බේරුම් කිරීම සඳහා බේරුම්කරුවන් වෙත භාරදෙන ලද ආරවුල් මාස තුනක් ගතවීමට පෙර විභාග කොට බේරුම් කර නැවත භාරදිය යුතුය. තමන්ට පාලනය කල නොහැකි හේතූන් මත පමණක් කාලය දීර්ඝ කර ගැනීමට සාධාරණ හේතු වෙතොත් එම හේතූද සමඟ මා වෙත ඉල්ලීම් ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය. මාස තුනකට අධික කාලයක් බේරුම්කරුවන් අතරැඳි විභාග කොට අවසන් කරනු ලබන <u>ණය ආරවුල්</u> සඳහා තීරක ගාස්තු ගෙවීමේදී පහත පරිදි අඩු කිරීම් කර ගෙවීම් කල යුතුය.

| අතරැඳි කාලය | ගාස්තු ගෙවීම |
|---|---|
| මාස 03 සිට මාස 04 දක්වා | තීරක ගාස්තුවෙන් 90% |
| මාස 04 සිට මාස 06 දක්වා | තීරක ගාස්තුවෙන් 50% |
| මාස 06 ට වැඩි | තීරක ගාස්තු ගෙවීම් නොකරයි |

07. තීරකකරණයට අදාල සැපයුම් කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව හා මූල්‍ය රීති ප්‍රකාරව සිදුකල යුතුය.

08. බේරුම්කරණය සඳහා සති අන්ත දින හෝ රජයේ නිවාඩු දින පමණක් යොදාගත යුතු බවට හා මීට යා කර ඇති ආදර්ශ ආකෘති (ආකෘති අංක 01 -05 දක්වා) බේරුම්කරණයේදී භාවිත කල යුතු අතර එම ආකෘතිවලට අනුව බේරුම්කරණ කටයුතු පවත්වාගෙන යා යුතු බවට සියළුම බේරුම්කරුවන් දැනුවත් කල යුතුය.

09. වැඩ අවසන් කරන ලද තීරක ගොනු වෙනුවෙන් ගෙවීම් ලබා ගැනීම සඳහා ආකෘති අංක 06 සමඟ පොදු 35 වවුචර්පතක් මඟින් ඉල්ලීම් ඉදිරිපත් කල යුතුය.

10. රජය විසින් වරින් වර පනවනු ලබන නීති රෙගුලාසි අනුව කලයුතු යම් අය කිරීමක් වේ නම් එම අයකිරීම්වලට යටත්ව තීරක ගාස්තු ගෙවිය යුතුය.

11. 2026.01.01 දින සිට ලැබී ඇති සියළුම ආරවුල් සම්බන්ධයෙන් ඉහත පරිදි ක්‍රියා කලයුතු අතර, 2025.12.31 දිනට පැවති සියළු ණය ආරවුල් 2026.05.31 දිනට අවසන් කර භාරදිය යුතුය.

12. සමුපකාර සමිති හා සම්බන්ධ ආරවුල් බේරුම්කරණය සම්බන්ධයෙන් මීට පෙර සමුපකාර පනතේ 58 වන වගන්තිය යටතේ මවිසින් නිකුත් කර ඇති 2022.08.20 දිනැති අංක 2022/02 දරණ චක්‍රලේඛය සහ 2024.01.24 දිනැති 2024/02 චක්‍රලේඛ මින් අවලංගු කරමි.

බෙනිකා ආර්. ජයසේකර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
දකුණු පළාත.

බෙනිකා ආර්. ජයසේකර
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත.

පිටපත්:

1. සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් - දැ.පි.
2. ගණකාධිකාරී - දැ.පි.
3. දකුණු පළාතේ සියළුම සමුපකාර සමිතිවල ගරු සභාපතිවරුන් වෙත - දැ.පි.

ආරවුල් අංකය:-..........................

ආකෘති අංක 1

# ආරවූලකට සම්බන්ධ වූ අයට හා සාක්ෂිකාරයින්ට යවන සිතාසි

පැමිණිලිකාර පාර්ශවය :-

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

වගඋත්තරකාර පාර්ශවය:-

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

3. ..........................................................................................................................

4. ..........................................................................................................................

ඉහත පාර්ශවයන් අතර ඇති වී තිබෙන්නා වූ පහත විස්තර කරන ලද ආරවුල විසඳීම පිණිස ..........................................................පදිංචි.......................................................................................................වන මා දකුණු පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්/ නියෝජ්‍ය කොමසාරිස්/................... දිස්ත්‍රික් සහකාර කොමසාරිස් විසින් බේරුම්කරු වශයෙන් පත් කරනු ලැබ සිටින හෙයින් ද, දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ වලංගුව තිබෙන ව්‍යවස්ථා පරිදි මා කටයුතු කරගෙන යන හෙයින්ද, යථෝක්ත ආරවුල විසඳීම සඳහා 20....... වන වර්ෂයේ..................... මය ........... වන දින පෙරවරු/පස්වරු ......................................ට................................................................................................... ලිපිනයේ පිහිටි.................................................................................................................... දී මා ඉදිරිපිට පෙනී සිටින ලෙස 2019 දකුණු පළාත් සමූපකාර සමිති රීතින්හි 44.(ix) රීතිය යටතේ මෙයින් ඉහත නම් සඳහන් යුෂ්මතාට/යුෂ්මතුන්ට නියම කරමි.

2* යුෂ්මතාගේ සාක්ෂිකාරයෝ වෙත්නම් ඔවුන් කැඳවාගෙන යුෂ්මතාට ප්‍රයෝජනවත් වන ලියකියවිලි ඇත්නම් ඒවාත් රැගෙන පැමිණිය යුතුය.

3* යුෂ්මතා නොපැමිණිය හොත් ඒකපාර්ශිකව විභාගය පවත්වා තීරණය දෙන බව මෙයින් දන්වමි.

වර්ෂ 20....../................මස

......................වන දින

....................දිය.

මීට,

..........................

බේරුම්කරු.

## ඉහත සඳහන් ආරවුලේ විස්තර

පැමිණිලිකාර පාර්ශවය විසින් ඉල්ලා ඇති රු........................................ මුදල හා ඊට අදාල පොලිය, නඩු ගාස්තු/ වෙනත් මුදලක් වගඋත්තරකාර පාර්ශවයෙන් අය විය යුතුද යන්න පිළිබඳව පැනනැගී ඇති ආරවුල.

ආකෘති අංක 2

ආරවුල් අංකය ....................................

## ප්‍රදානය (ණය මුදල්)

දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ,

(අ) 53 වෙනි වගන්තිය

(ආ) 46 වෙනි හා 48.(1).(ඇ) වෙනි වගන්තිය

සමඟ කියවනු ලබන එම සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ පනවන ලද රීති 44(x) යටතේ ප්‍රදානය කරන ලදී.

පැමිණිලිකරු වශයෙන් ලියාපදිංචි කළ සමිතියක් වන .............................. ........................................................... සමුපකාර සමිතිය හා වගඋත්තරකරුවන් වශයෙන් ඉහත කී සමිතියේ සාමාජිකයන් වන ..............................................................................................................................................

..............................................................................................................................................

සදිංචි ණයකාර ..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

පදිංචි ඇපකාර ..............................................................................................................................................

හා..............................................................................................................................................

..............................................................................................................................................

පදිංචි ඇපකාර ..............................................................................................................................................

අතර ණය මුදල වශයෙන් රුපියල් ..............................................................................................................................................

(රු. ........................................) ක්ද ප්‍රදානය දෙන දින දක්වා වාර්ෂිකව සියයට ..............(.....%) බැගින් පොලිය ද, නඩු ගාස්තු ද, ඔබනත් වියදම් ද ඉහත සඳහන් වගඋත්තරකරුවන් ගෙන් අයවිය යුත්තේද යන්න ආරවුලක් පැන නැගී ඇත.

දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 72 වගන්තිය සමඟ කියවෙන එම ප්‍රඥප්තියේ 2.(4) වගන්තිය යටතේ අංක ...................... හා ........................................දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයෙන් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් ........................................................................................ යන අය වෙත පැවරුනු බලතල අනුව, සමුපකාර සමිති ප්‍රඥප්තියේ 53 වෙනි වගන්තිය යටතේ එකී ආරවුල නිරවුල් කොට තීන්දුවක් ලබාදීම සඳහා බේරුම්කරු වශයෙන් ..........................................................................................වන මා වෙත .............................. දින භාර කරන ලදී.

ඉහත සඳහන් ආරවුල ගැන මනා ලෙස විභාග කොට ඉහත කියන ලද වගඋත්තරකරුවන් වන

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

යන අය විසින් ඉහත කියන ලද .............................................................................................................................................. සමුපකාර සමිතියට මුළු මුදල වශයෙන් පහත සඳහන් පරිදි රුපියල් ................................ .................................. .................................. ...................... (රු.......................................)ක් ගෙවිය යුතු බවට තීන්දු කරමි.

★ ආරවුලේ එක් පාර්ශවයක් ඇපකරුවෙකු නොවන විට (ආ) වගන්තිය කපා හරින්න

<u>තීන්දුව ලබා දුන් ආකාරය</u>

| | |
|---|---|
| හිඟ ණය මුදල | රු. .......................... |
| ප්‍රදානය දෙන දින දක්වා ............% බැගින් පොලිය | රු. .......................... |
| නඩු ගාස්තු | රු. .......................... |
| වෙනත් (.................................) | රු. .......................... |
| එකතුව | රු. .......................... |

ඉහත ප්‍රදානය කරන ලද මුදල ............................ දින හෝ ඊට පෙර ගෙවිය යුතුය. තවද එම මුදල එදිනට හෝ ඊට පෙර නොගෙවන්නේ නම්, දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 54 වගන්තිය යටතේ අයකර ගත හැකි බවද දන්වමි.

මෙම තීන්දුවට (ප්‍රදානයට) විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, දකුණු පළාත් සමුපකාර සමිති කොමසාරිස් / රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු බවත් එවැනි අභියාචනයක්,

අ - ලිඛිතව කළ යුතු බවත්,

ආ - අභියාචනය කිරීමට හේතු අඩංගු කළ යුතු බවත්,

ඇ - අද දින සිට දින 60 ක් ඇතුලත එනම් ............................ දින හෝ ඊට පෙර අභියාචනා ඉදිරිපත් කළ යුතු බවත්,

ඈ - අවශ්‍ය අභියාචනා තැන්පතක් වන රු................................ ක් (පැමිණිලිකරු) ද හෝ රු........................... ක් (වගඋත්තරකරු) ද ඒ සමඟ ඉදිරිපත් කළ යුතු බවත්, පැමිණිලි හා වගඋත්තරකාර පාර්ශවයට දන්වමි.

දිනය ...........................

..........................................
බේරුම්කරු

---

අභියාචනාවක් ඇත්නම්:-

1. අභියාචනා ලැබුණු දිනය ..................................................................................................
2. අභියාචනා පිළිබඳ කොමසාරිස්ගේ තීන්දුව ..............................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

ආකෘති අංක 3

ආරවුල් අංකය ..........................................

# ප්‍රදානය (විවිධ ඉල්ලීම්)

දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 72 වගන්තිය සමඟ කියවෙන,

(අ) 53 වෙනි වගන්තිය

(ආ) 46 වෙනි හා 48.(1).(ඈ) වෙනි වගන්තිය

සමඟ කියවනු ලබන එම සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ පනවන ලද රීති 44(x) යටතේ ප්‍රදානය කරන ලදී.

පැමිණිලිකරු වශයෙන් ලියාපදිංචි කළ සමිතියක් වන සීමා සහිත/ සීමා රහිත ..........................................................................................................................................................................................................................  සමුපකාර සමිතිය හා වගඋත්තරකරුවන් වශයෙන් එම සමිතියේ ............................................ වන ........................................................................................ හා ............................................... වන .......................................................................................... හා ............................................... වන ..........................................................................................අකර

රු.

i. ................................................................ ..................

ii. ................................................................ ..................

iii. ................................................................ ..................

මුළු මුදල ..................

වශයෙන් රුපියල් ..................................................................................................................................

(රු. .......................................) ක්ද ප්‍රදානය දෙනා දින දක්වා වාර්ෂිකව සියයට ..............(.....%) බැගින් පොලිය ද, නඩු ගාස්තු ද, වෙනත් වියදම් ද ඉහත සඳහන් වගඋත්තරකරුගෙන්/ වගඋත්තරකරුවන්ගෙන් ගෙවා අයවිය යුත්තේද යන්න ආරවුලක් පැන නැගී ඇත.

දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 2.(4) වගන්තිය යටතේ අංක ............................... හා ............................ දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයෙන් සමුපකාර සංවර්ධන නියෝජ්‍ය/ සහකාර .................................... ............................................... යන අය වෙත පැවරුනු බලතල අනුව, එකී ප්‍රඥප්තියේ 53 වෙනි වගන්තිය යටතේ උක්ත ආරවුල නිරවුල් කොට තීන්දුවක් ලබාදීම සඳහා බේරුම්කරු වශයෙන් ...................................................................................................... වන මං වෙත ................................. දින භාර කරන ලදී.

ඉහත සඳහන් ආරවුල ගැන මනා ලෙස විභාග කොට ඉහත කියන ලද වගඋත්තරකරුවන් වන

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

යන අය විසින් ඉහත කියන ලද සීමාසහිත/ සීමාරහිත ............................................................................ .......................................................................... සමිතියට මුළු මුදල වශයෙන් පහත සඳහන් පරිදි රුපියල් ..........................................................................................................(රු.................................)ක් ගෙවිය යුතු බවට තීන්දු කරමි.

---

★ ආරවුලේ එක් පාර්ශවයක් ඇවරකරුවෙකු නොවන විට (ආ) වගන්තිය කපා හරින්න

**<u>තීන්දුව ලබා දුන් ආකාරය</u>**

| | |
|---|---|
| ප්‍රදානය කරන ලද මුදල | රු. .......................... |
| ප්‍රදානය දෙන දින දක්වා .............% බැගින් පොලිය | රු. .......................... |
| නඩු ගාස්තු | රු. .......................... |
| වෙනත් (.................................) | රු. .......................... |
| එකතුව | රු. .......................... |

ඉහත ප්‍රදානය කරන ලද මුළු මුදල .................. දින හෝ ඊට පෙර ගෙවිය යුතුය. තවද එම මුදල එදිනට හෝ ඊට පෙර නොගෙවන්නේ නම්, දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 54 වගන්තිය යටතේ අයකර ගත හැකි බවද දන්වමි.

මෙම තීන්දුවට (ප්‍රදානයට) විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, දකුණු පළාත් සමුපකාර සමිති කොමසාරිස් / රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු බවත් එවැනි අභියාචනයක්,

අ - ලිඛිතව කළ යුතු බවත්,

ආ - අභියාචනය කිරීමට හේතු අඩංගු කළ යුතු බවත්,

ඇ - අද දින සිට දින 60 ක් ඇතුලත එනම් ............................ දින හෝ ඊට පෙර අභියාචනා ඉදිරිපත් කළ යුතු බවත්,

ඈ - අවශ්‍ය අභියාචනා තැන්පත් වන රු.................................. ක් (පැමිණිලිකරු) ද හෝ රු.......................... ක් (වගඋත්තරකරු) ද ඒ සමඟ ඉදිරිපත් කළ යුතු බවත්, පැමිණිලි හා වගඋත්තරකාර පාර්ශවයට දන්වමි.

දිනය ..........................

....................................

බේරුම්කරු

---

අභියාචනාවක් ඇත්නම්:-

1. අභියාචනා ලැබුණු දිනය ..................................................................................................
2. අභියාචනා පිළිබඳ කොමසාරිස්ගේ තීන්දුව .............................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

ආකෘති අංක 04

## තීරක දින සටහන

නඩු අංකය :- ......................................

1. පැමිණිලිකරුගේ නම :- ........................................................................................

2. විත්තිකරුවන්ගේ නම :-

   1. ..................................................................
   2. ..................................................................
   3. ..................................................................

3. පැමිණිල්ලෙන් ඉල්ලන ලද මුදල :- රු. ........................

4. මුදල සම්බන්ධ විස්තර :- හිඟ ණය මුදල් රු..............., පොළිය රු............., නඩු ගාස්තු රු. .........

5. තීරක තැනගේ නම :- ..............................................

6. තීරක තැන පත්කළ දිනය :- ..............................

7. සිතාසි නිකුත් කළ දිනය :- ..........................................

8. ලියාපදිංචි කුවිතාන්සි අංක :- .......................................................................

9. විභාග පැවැත්වූ දිනයන් :- ..........................................

10. විභාගයට පැමිණ සිටි අය :-

    I. පැමිණිලිකරු - සීමා රහිත ඉඳුරන්නාවිල සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති........................

    II. පැමිණිල්ලේ නීති නියෝජිත - ........................................................................

    III. පැමිණිල්ලේ සාක්ෂිකරුවන් - ......................................................................

    IV. විත්තිකරු - ..................................................................

    විත්තිකරුගේ සාක්ෂිකරුවන් - ......................................................................

11. තීන්දුව දෙන ලද දිනය :- ..............................................

12. තීන්දුව අනුව ගෙවීමට නියම කළ මුදල :- රු. ..........................................

13. විභාගයට නොපැමිණි විත්තිකරුවන් වෙත ප්‍රදානයේ පිටපත් ලි.ප.තැ කළ කුවිතාන්සි අංක හා දිනයන් } ........................................ / ..........................................

දිනය :- ..........................................

................

තීරක තැන

ආකෘති අංක 05

ආරවුල් අංකය :-

සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය

20......./......./........ වන දින

සාමාන්‍යාධිකාරි / ලේකම් / ඇවරකරු

සී/ස ............................................................. සමිතිය

.........................................................................................

## තීරක තීන්දුව දෙපාර්ශවයට දැන්වීම

..............................................................................................................................

(පැමිණිල්ල)

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(වගඋත්තරකරු/වගඋත්තරකරුවන්)

20.................... දින ප්‍රකාශ කර ඇති ඉහත සඳහන් ආරවුලේ තීන්දුව අනුව වගඋත්තරකරු/වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකාර සක්ෂයට.........................................................

..............................................................................................................................

(රු. ...............................) ක් ගෙවිය යුතුයැයි නියම කර ඇත. මෙම තීන්දුවට ඔබ එකඟ නොවන්නේ නම් තීන්දුව දුන් දින සිට දින හැටක් (60) ඇතුළත නිසි හේතු දක්වමින් රු.........................................ක් අභියාචනා තැන්පත් මුදලක් ද සමග දකුණු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් / රෙජිස්ට්‍රාර් වෙත අභියාචනයක් ඉදිරිපත් කල හැකි බව දන්වමි. එම අභියාචනයේ එක් පිටපතක් වගඋත්තරකරුවන් වෙත යවා පිටපතක් මා වෙත ද එවන්න.

..........................................................

ස.සං. සහකාර කොමසාරිස්

පිටපත්: වගඋත්තරකරුවන්ට

1. ..............................................................................................................................
2. ..............................................................................................................................
3. ..............................................................................................................................

මෙම තීන්දුවට ඔබ එකඟ නොවන්නේ නම් නිසි හේතු දක්වමින් අභියාචනා තැන්පත් වශයෙන් රු. ........................ ක මුදලක් ද සමඟ ........................ දින හෝ ඊට පෙර ලැබෙන සේ දකුණු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් / රෙජිස්ට්‍රාර් වෙත අභියාචනයක් ඉදිරිපත් කල හැකි බව දන්වමි. එම අභියාචනයේ එක් පිටපතක් පැමිණිලිකරු වෙත යවා තවත් පිටපතක් මා වෙත එවන්න.

ආකෘති අංක 06

## අවසන් කරන ලද තීරක ගොනු සඳහා ගෙවීම් ලබා ගැනීම - 2026.01.01 සිට ලැබී ඇති තීරක ගෙවීම් සඳහා

නම: ..............................................................................................

තනතුර: ..............................................................................................

කාර්යාලය: ..............................................................................................

කාර්යාලය වෙත ආපසු භාර දුන් දිනය..............................................................

| | A | B | C | D | E | F | G | H | I |
|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංක. | තීරක අංකය | සමිතියේ නම | තීරක ගාස්තු අයවූ දිනය | රිසිට් පත් අංකය | සමිතියෙන් අයවූ මුදල රු. | තීරක වෙත භාරදුන් දිනය | තීරක ගාස්තුව රු. | තැපැල් ගාස්තුව රු. | එකතුව රු. |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | මුළු එකතුව | | | | | | | | |

ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තැපැල් ගාස්තුව ප්‍රතිපූරණයට අදාල සියළු බිල්පත් ..............................දරණ තීරක ගොනුවේ අමුණා ඇති බවත්, ආරවුල් විභාග කටයුතු සඳහා .............................................. දිනය/ දිනයන් යොදා ගත් බවත් සහතික කරමි.

බේරුම්කරු:

පරීක්ෂා කලේ: